# වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය - 2021

## ප්‍රශ්නාවලිය (ASI-Q) සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්

ශ්‍රී ලංකාවේ නිල සංඛ්‍යා දත්ත සැපැයීමේ බලය ලත් ආයතනය වන ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මෙරට කර්මාන්ත අංශයේ සංවර්ධනයට අවශ්‍ය තොරතුරු සම්පාදනය කිරීමේ අරමුණින් වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය සිදු කරන ලැබේ. ඒ සඳහා වූ දත්ත රැස් කිරීමට සකස් කරන ලද මෙම ප්‍රශ්නාවලිය (ASI-Q) ප්‍රශ්න 25 කින් සමන්විතය. මෙම ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමේ දී ඔබට උපදෙස් අවශ්‍ය වන්නේ යැයි හැඟෙන ප්‍රශ්න සඳහා වූ පැහැදිලි කිරීම් පහත දැක්වේ. මෙම උපදෙස් අනුව ප්‍රශ්නාවලිය සම්පූර්ණ කළ යුතු අතර මේ සම්බන්ධයෙන් වැඩි දුරටත් උපදෙස් අවශ්‍ය වන්නේ නම් අප දෙපාර්තමේන්තුවේ කර්මාන්ත අංශයේ අධ්‍යක්ෂ අමතන්න. (දු.අ.: 011 2147401)

### ප්‍රශ්න අංක 13. කර්මාන්තය පිළිබඳ විස්තර

ආයතනයක් මඟින් නිපදවනු ලබන නිෂ්පාදිත භාණ්ඩ එකක් හෝ ඊට වැඩි ගණනක් මඟින් යම්කිසි කර්මාන්තයක් හඳුනාගත හැක. සාමාන්‍යයෙන් මෙම නිෂ්පාදිත භාණ්ඩ, සමජාතීය හෝ එකිනෙකට සම්බන්ධකමක් දක්වන නිෂ්පාදන භාණ්ඩ අඩංගු කාණ්ඩයක් යටතට ගැනේ. ඒ අනුව ඔබ ආයතනයේ නිෂ්පාදිත භාණ්ඩ අයත් වන නිෂ්පාදන කාණ්ඩය හෝ කාණ්ඩ විස්තර කරන්න. කරුණාකර එවැනි එක් නිෂ්පාදන කාණ්ඩයක දත්ත ඉදිරිපත් කිරීම සඳහා වෙනම ප්‍රශ්නාවලියක් බැගින් භාවිත කරන්න.

උදා: සබන් හා පොල් තෙල් නිපදවන කර්මාන්තශාලාවක් සඳහා ප්‍රශ්නාවලි දෙකක්ද, කලිසම් හා කමිස නිෂ්පාදනය කරන කර්මාන්ත ශාලාවක් සඳහා එක් ප්‍රශ්නාවලියක් ද සම්පූර්ණ කළ යුතු වේ.

### ප්‍රශ්න අංක 16. සංවර්ධන හා පර්යේෂණ කටයුතු

ඔබ ආයතනය 2020 වර්ෂය තුළ සංවර්ධන හා පර්යේෂණ කටයුතු වල නියුතු වූයේ ද යන්න මේ යටතේ දැක්විය යුතුය.

සංවර්ධන හා පර්යේෂණ කටයුතු යනුවෙන් අදහස් කරනුයේ ආයතනය විසින් සිදු කරනු ලබන නිෂ්පාදන කටයුතු වලට අදාළව නව සොයා ගැනීම් සිදු කිරීමේ අරමුණින් හෝ වැඩි දියුණු කිරීමේ අරමුණින් හෝ නිෂ්පාදන ක්‍රියාවලි පිළිබඳව දැනුම වර්ධනය කර ගැනීමේ අරමුණින් සිදු කරනු ලබන පර්යේෂණ කටයුතු වේ.

### ප්‍රශ්න අංක 17. නිෂ්පාදන ධාරිතාව, ආයතනයෙන් පිට කරන ලද භාණ්ඩ සහ නිමි භාණ්ඩ තොග

**(i)** **තීරුව -** කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි . මෙහි කිසිවක් නොලියන්න.

**(ii)** **තීරුව - නිෂ්පාදිත භාණ්ඩ විස්තර**

මේ යටතේ ආයතනයේ නිෂ්පාදනය කර පිට කරන ලද සියලුම භාණ්ඩ පිළිබඳ සවිස්තර තොරතුරු අවශ්‍ය වේ.

උදා: කමිස (ටෙට්රෝන්), ට්‍රැක්ටර් (රෝද දෙක)

ආයතනයේ නිෂ්පාදනය කර පිට කරන සියලුම භාණ්ඩ වල මුළු වටිනාකමෙන් අඩු වශයෙන් 75% ක් වටිනා භාණ්ඩ වල විස්තර වෙන වෙනම සපයන්න. ඉතිරි භාණ්ඩ වල මුළු වටිනාකම් වල එකතුව වෙනත් නිෂ්පාදන (08 වැනි පේළිය) යටතේ සඳහන් කරන්න.

කර්මාන්තශාලාවේ සිට එම ව්‍යාපාරයටම අයත් තොග හෝ සිල්ලර වෙළඳසැල් ඇතුළු වෙනත් ආයතන වෙත ගෙන යන ලද භාණ්ඩ ද මීට ඇතුළත් විය යුතුය.

ඉහත (ii) තීරුවේ ඇතුළත් කර ඇති භාණ්ඩ වලට අදාළ තොරතුරු පහත සඳහන් අන්දමට නියමිත තීරුවල ඇතුළත් කළ යුතුය.

**(iii)** **තීරුව - මිනුම් ඒකකය**

හැම විටම මෙට්‍රික් ඒකක භාවිතා කළ යුතුය.

**(iv) තීරුව - නිෂ්පාදන ධාරිතාවය**

නිෂ්පාදන ධාරිතාවය යනු පවතින යන්ත්‍ර සූත්‍ර වලින් හා සේවක සංඛ්‍යාවෙන් යෙදවිය හැකි උචිතම සේවා මුර සංඛ්‍යාවක් ප්‍රයෝජනයට ගෙන වර්ෂය තුළ දී නිෂ්පාදනය කළ හැකි උපරිම භාණ්ඩ ප්‍රමාණයයි. එක් එක් භාණ්ඩ සඳහා වෙන වෙනම ධාරිතාවය සැපයිය යුතුය. වර්ෂය තුළ නිෂ්පාදිතය යෝජිත නිෂ්පාදන ධාරිතාවෙන් 80% කට වඩා අඩු නම් ඊට බලපෑ හේතු පසු පිටේ වෙන් කර ඇති සටහන්හි දක්වන්න.

**(V) සහ (vi) තීරු - ආයතනයෙන් පිට කරන ලද සියලුම භාණ්ඩ**

ආයතනයෙන් පිට කරන ලද භාණ්ඩවල ප්‍රමාණය සහ වටිනාකම පිළිවෙලින් තීරු අංක **(V) සහ (vi) යටතේ** දැක්විය යුතුය.

- ආයතනය සතු අමුද්‍රව්‍ය ප්‍රයෝජනයට ගෙන තම ආයතනය විසින්ම නිෂ්පාදනය කරන ලද භාණ්ඩ
- ආයතනය සතු අමුද්‍රව්‍ය ප්‍රයෝජනයට ගෙන වෙනත් ආයතනයක් විසින් නිෂ්පාදනය කරන ලද භාණ්ඩ විය හැකිය.

**" පිට කරන ලද භාණ්ඩ "** පහත සඳහන් කර ඇති භාණ්ඩ වලට අයත් වේ.

- ➢ වෙනත් ආයතන වලට පිට කළ භාණ්ඩ
- ➢ මෙම ව්‍යාපාරයට අයිති වෙනත් ආයතන වලට ( තොග හෝ සිල්ලර අලෙවිසැල් ද ඇතුළුව ) පිට කරන ලද භාණ්ඩ
- ➢ අපනයනය කරන ලද භාණ්ඩ
- ➢ පාරිභෝගිකයන් සඳහා අලෙවි කරන ලද භාණ්ඩ

ආයතනයෙන් පිට කරන ලද භාණ්ඩ වල වටිනාකම ඇගයිය යුත්තේ මූලික මිල ගණන් (Basic prices) අනුව ය.
***මූලික මිල යනු නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ ඒකකයක් වෙනුවෙන් ගැණුම්කරුගෙන් නිෂ්පාදකයා අය කරනු ලබන ඒකක මිල වේ. මෙහි දී එම භාණ්ඩය නිෂ්පාදනය කිරීම හෝ වෙළඳාම මත නිෂ්පාදකයා විසින් ගෙවනු ලබන බදු මීට අයත් නොවන අතර ඒ වෙනුවෙන් ලද සහනාධාර මීට අයත් වේ.*** තව ද මෙහි දී ප්‍රවාහන වියදම් එකතු කරනු නොලැබේ. මිල ප්‍රතිදාන වට්ටම් හා ආපසු භාර දුන් භාණ්ඩ වෙනුවෙන් ගැනුම්කරුට දෙනු ලබන දීමනා අඩු කළ යුතුය. එකම ව්‍යාපාරයකට අයත් වෙනත් ආයතන වලට පිට කරන ලද භාණ්ඩ විකුණූ භාණ්ඩ සේ සළකා ඒවා මූලික මිල අනුව ඇගයිය යුතුය.

**(Vii) තීරුව - අපනයනය කිරීම**

මෙමඟින් ආයතනයෙන් පිට කරන ලද නිෂ්පාදන භාණ්ඩ වලින් 2020 වසර තුළ ආයතනය විසින්ම අපනයනය කළ කොටස ආවරණය කෙරේ. එවැනි අපනයනයන්ගේ ප්‍රමාණය පමණක් මෙහි සඳහන් කළ යුතුය.

**(Viii) සිට (xi) දක්වා තීරු - ඉතිරි නිමි භාණ්ඩ තොග**

මෙහි සියලුම නිමි භාණ්ඩ වල ආරම්භක තොග හා අවසාන තොග ඇතුළත් විය යුතුය.

- ➢ ආයතනය සතු අමුද්‍රව්‍ය ප්‍රයෝජනයට ගනිමින් ආයතනය විසින්ම නිම කරන ලද භාණ්ඩවල තොග
- ➢ ආයතනය සතු අමුද්‍රව්‍ය වලින් අන් ආයතනයක් මඟින් නිෂ්පාදනය කරන ලද භාණ්ඩවල තොග මෙයට ඇතුළත් විය යුතුය. අන්‍යයන් සතු අමුද්‍රව්‍ය වලින් නිපදවන ලදුව යොමු දිනය වන විට මෙම ආයතනයේ රඳවා ගෙන ඇති නිමි භාණ්ඩ තොග අත්හල යුතුය. වර්ෂය ආරම්භයේ හා වර්ෂය අවසානයේ තිබූ නිමි භාණ්ඩ තොගවල ප්‍රමාණය හා වටිනාකම වාර්තා කළ යුතුය. ඇගයිය යුත්තේ මූලික මිල ගණන් අනුවය.
- ➢ මෙම ආයතනයේ නිෂ්පාදනය වෙමින් පවතින අර්ධ නිමි භාණ්ඩ වල ආරම්භක තොග හා අවසාන තොගවල වටිනාකමද පිළිවෙලින් ix හා xi තීරුවල අදාළ පේළියේ සටහන් කරන්න.

**(xii) කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා** - මෙම තීරුව හිස්ව තබන්න.

## ප්‍රශ්න අංක 18. කාර්මික සහ කාර්මික නොවන සේවා වලින් ලැබීම්

### 18.1 අන්‍යයන් සඳහා කරන ලද කාර්මික සේවා වලින් ලැබීම්

පහත සඳහන් ලැබීම් මෙහි ඇතුළත් කරන්න.

- අන් ආයතන සතු අමුද්‍රව්‍ය වලින් කොමිස් හා කොන්ත්‍රාත් පදනමක් මත එකී ආයතනයට කරන ලද වැඩ සඳහා ලැබීම්. උදා: වී කෙටීම, රෙදි මුද්‍රණය, කුලියට ඇඳුම් මැසීම

- අන්‍යයන් සඳහා ඔබ ආයතනය මඟින් කරන ලද අළුත්වැඩියා කිරීම් හා නඩත්තු කිරීම් සඳහා ලැබීම්. මෙමඟින් වෙනත් ව්‍යාපාර වලට, මෙම ව්‍යාපාරයටම අයත් වෙනත් ආයතන වලට හෝ තනි පුද්ගලයින්ට කරන ලද අළුත්වැඩියා කිරීම් හා නඩත්තු වැඩ ආවරණය කෙරේ.
- සංවර්ධන හා පර්යේෂණ කටයුතු

**18.2 මිල දී ගත් තත්වයෙන් ම අළෙවි කරන ලද භාණ්ඩ**

ඔබ ආයතනය විසින් කිසියම් භාණ්ඩයක්/ භාණ්ඩ මිල දී ගත් තත්වයෙන්ම අළෙවි කළේ නම් එමඟින් උපයන ලද ආදායම මේ යටතේ දැක්විය යුතුය.

උදා: ඇඟලුම් නිෂ්පාදනය කරනු ලබන ආයතනයක් ඊට අදාළ අමුද්‍රව්‍ය ලෙස ආනයනය කරනු ලබන රෙදි වලින් කොටසක් තවත් එවැනිම ඇඟලුම් නිෂ්පාදන සිදු කරනු ලබන ආයතනයකට විකිණීම

**18.3 ප්‍රවාහන සේවා සැපයීම**

ඔබ ආයතනය විසින් පාරිභෝගිකයින්ට අලෙවි කරන ලද භාණ්ඩ, පාරිභෝගිකයා වෙත ප්‍රවාහනය කර දීමෙන් යම් ආදායමක් උපයන්නේ නම් 2020 වර්ෂයට අදාළ එලෙස උපයන ලද අදාදායම මේ යටතේ දැක්විය යුතු ය.

උදා: ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබන ආයතනයක් විසින් තම නිෂ්පාදන අළෙවි කිරීමේ දී පාරිභෝගිකයාගේ නිවසට අදාළ භාණ්ඩය ප්‍රවාහනය කර දී ඔහුගෙන් ප්‍රවාහන ගාස්තු අය කිරීම.

**18.4 හිමිකම් භාගය (Royalty income)**

කිසියම් ආයතනයක් තම ආයතනයට අයත් වෙළඳ ලකුණ (Trade mark), පේටන්ට් (Patent), ප්‍රකාශන අයිතිය (Copyright), අයිතිය පැවරීමේ ගාස්තු ( Franchise) යන ආදිය වෙනත් ආයතන වලට ද භාවිත කිරීම ඉඩ දී ඇත්නම් එමඟින් 2020 වර්ෂය තුළ උපයන ලද ආදායම මේ යටතේ දැක්විය යුතුය.

**18.5 සුන්බුන් අළෙවි කිරීම**

බොහෝ ආයතන භාවිත කරන ලද භාණ්ඩ තාක්ෂණය වෙනස් වීම, ආයතනයට නව මුහුණුවරක් ලබා දීම, භාවිත කළ පසු ආයතනයට වැදගත් නොවීම වැනි කාරණා මත අළෙවි කරන අවස්ථා ඇත. තව ද ආයතනයේ සුන්බුන්, අප ද්‍රව්‍ය ආදිය ද අළෙවි කරන අවස්ථා පවතී. මෙමඟින් උපයන ලද ආදායම මේ යටතේ ගැනේ.

උදා:

I. ආයතනයේ අලෙවි කිරීමට මිල දී ගත් භාණ්ඩ වලට අදාළ ඇසුරුම් ද්‍රව්‍ය අලෙවි කිරීම
II. ආයතනයේ කැඩී, බිඳී ඇති කාර්යාලයීය උපකරණ සහ ගෘහ භාණ්ඩ ආදිය අලෙවි කිරීම

**18.6 නිෂ්පාදනය සඳහා වූ වෙනත් සහනාධාර**

**සහනාධාර යනු** මහජනතාවගේ යහපත උදෙසා, ආයතනයක ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යෑමට හෝ සංවර්ධනයට රජයෙන් දෙනු ලබන විශේෂ දීමනාවක් හෝ බදු සහනයකි. මෙහි දී ඔබ විසින් දත්ත සැපයිය යුත්තේ <u>නිෂ්පාදන ඒකක ගණන මත ලබා දෙන සහනාධාර නොව</u> සමස්ථ නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා රජය විසින් ලබා දෙන සහනාධාර වේ.

**18.7 වෙනත් ආදායම්**

ඉහත සඳහන් අයිතයම වලට අයත් නොවන ආදායම් වේ නම් එම ආදායම් මේ යටතේ දැක්විය යුතු ය.

උදා: කිසියම් ආයතනයක ආපනශාලාවක් පවත්වාගෙනයෑම මඟින් ආදායම් ඉපැයීම

**සැ.යු.:**

ලාභාංශ ලැබීම්, පොලිය ලැබීම්, පේටන්ට් සහ බලපත්‍ර මුළුමනින් ම අළෙවි කිරීම්, ඉඩම් අලෙවි කිරීම සහ භාවිත කරන ලද ප්‍රාග්ධන භාණ්ඩ අළෙවි කිරීම යන ආදිය මඟින් උපයන ලද ආදායම් මීට ඇතුළත් නොකළ යුතුය.

## ප්‍රශ්න අංක 19. කාර්මික සහ කාර්මික නොවන සේවා මිල දී ගැනීම සඳහා වූ පිරිවැය

**19.1 අන්‍යයන් විසින් ඔබ ආයතනය සඳහා කරන ලද කාර්මික සේවා සඳහා වූ පිරිවැය**

- ඔබ විසින් සපයන ලද අමුද්‍රව්‍ය උපයෝගී කර ගෙන කොමිස් හෝ කොන්ත්‍රාත් පදනම මත අන්‍යයන් විසින් කරන ලද වැඩ හා

- අන්‍යයන් විසින් කරන ලද අලුත්වැඩියා කිරීම් හා නඩත්තු කිරීම් සඳහා වියදම් මීට අයත් වේ.

**19.2 නඩත්තු, අලුත්වැඩියා සහ ස්ථාපනය කිරීමේ පිරිවැය**
අදාළ කාල සීමාව තුළ ආයතනය විසින් සිදු කරන ලද නඩත්තු කිරීම් සහ අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් දරන ලද වියදම් මීට අයත් වේ. මෙහි දී ගොඩනැගිලි මෙන්ම යන්ත්‍රෝපකරණ වල කරන ලද සුළු අලුත්වැඩියාවන් හා නඩත්තු වලට වැය වූ මුදල මේ යටතේ සඳහන් කළ යුතුය. මෙම ගොඩනැගිලි හා යන්ත්‍ර සූත්‍ර ආයතනයට අයත් හෝ කුලියට ගත් ඒවා වුව ද ඒවායේ කරන ලද සුළු නඩත්තු හා අලුත් වැඩියා කටයුතු වෙනුවෙන් අදාළ යොමු කාලය තුළ ආයතනය වැය කරන ලද මුදල මේ තීරයේ සඳහන් කළ යුතුය. තව ද ආයතනය විසින් මිල දී ගත් යන්ත්‍ර හෝ මෘදුකාංග සවිකිරීමේ කටයුතු වෙනුවෙන් දරන ලද වියදම මේ යටතේ සඳහන් කළ යුතුය.

උදා: කිසියම් ආයතනයක් සඳහා මිල දී ගත් වායු සමීකරණ යන්ත්‍රයක් අදාළ ස්ථානයක සවි කිරීම වෙනුවෙන් වැය වූ මුදල

**19.3 ප්‍රවාහන සේවා වියදම්**
ආයතනය විසින් පුද්ගලයන් හෝ භාණ්ඩ ප්‍රවාහනය සඳහා වැය කළ මුදල මීට අයත් වේ. ඒ අනුව වාහන කුලියට ගෙන ප්‍රවාහන සේවා ලබා ගැනීම පමණක් මේ යටතේ දැක්විය යුතුය. තම ආයතනය සතු වාහන මඟින් සිදුකරන ප්‍රවාහන කටයුතු මීට අයත් නොවේ.

උදා: ආයතනයක භාණ්ඩ හෝ පුද්ගලයින් ප්‍රවාහනය වෙනුවෙන් අදාළ වර්ෂයේ යොදා ගත් කුලී රථ වෙනුවෙන් දරන ලද වියදම්

**19.4 සන්නිවේදන සේවා සඳහා වියදම්**
ආයතන විසින් 2020 වර්ෂය සඳහා ආයතනික කටයුතු වෙනුවෙන් වැය කරන ලද දුරකථන ගාස්තු, තැපැල් හා අන්තර්ජාල ප්‍රවේශ ගාස්තු, ෆැක්ස්, වෙබ් අඩවි පවත්වාගෙනයෑම වැනි කාරණා සඳහා වැය වූ මුදල් ද මේ යටතට ඇතුළත් වේ.

**19.5 ප්‍රචාරක සහ ප්‍රවර්ධන සේවා සඳහා වියදම්**

අලුත් භාණ්ඩයක් හෝ සේවාවක් වෙළඳ පොළට ඉදිරිපත් කිරීමේ දී හෝ නිෂ්පාදන විවිධාංගීකරණය හෝ විශේෂීකරණය හෝ යටතේ දැනට නිපදවන භාණ්ඩය හෝ සේවාව සමඟ අතුරු නිෂ්පාදනයක් ඉදිරිපත් කිරීමේ දී වෙළඳපොළට ඉදිරිපත් කර ඇති භාණ්ඩය හෝ සේවාව පාරිභෝගිකයාගේ මතකයෙන් ඈත් නොවීම සඳහා ආයතනය විසින් අදාළ යොමු කාලය තුළ රූපවාහිනී, පුවත්පත්, වරින් වර කරන ප්‍රචාරණය හා අනෙකුත් මාධ්‍ය මඟින් සිදු කරන ලද ප්‍රචාරක හා ප්‍රවර්ධන ක්‍රියාවලීන් වල දී වැය වූ මුදල මේ යටතේ ඇතුළත් කළ යුතුය. එමෙන්ම අනෙකුත් ආයතනයන්ට මුදල් ගෙවීම මඟින් සිදු කරන වෙළඳපොළ පර්යේෂණ ක්‍රියාවලීන් හා මහජන සම්බන්ධතා කටයුතු හරහා සිදු කරන වෙළඳ ප්‍රවර්ධන ක්‍රියාවලීන්ට වැයවන මුදල් ද මීට අයත් වේ.

උදා:
දැන්වීම් පුවරු, පත්‍රිකා, ගුවන් විදුලි දැන්වීම්, පුවත්පත් දැන්වීම් මඟින් ආයතනයේ බෙදාහැරීම් භාණ්ඩ පිළිබඳ ජනතාව දැනුවත් කිරීම, භාණ්ඩ මිල අඩු කිරීම්, වෙනත් භාණ්ඩ නව භාණ්ඩ හඳුන්වා දීම් ආදිය සඳහා වැය කළ මුදල.

සැ.යු.:
කිසියම් ආයතනයක් විසින් තම කාර්යමණ්ඩලය යොදවා සිදු කරනු ලබන වෙළඳපොළ සමීක්ෂණ මීට අයත් නොවේ.

**19.6 මූල්‍ය සේවා වියදම්**

මූල්‍ය අතරමැදිකරණ සේවා වෙනුවෙන් ආයතනය විසින් සෘජුවම ගෙවිය යුතු ගාස්තු සහ අයකිරීම් මීට අයත් වේ.

උදා: බැංකු ඇප ලබාදීම, මූල්‍ය කළමනාකරණ උපදේශන සේවා සැපයීම, බැංකුවක ආරක්ෂිත සේප්පුවක් පවත්වාගෙනයෑම වැනි කාරණා සඳහා බැංකුවට කරවන ගෙවීම්

සැ.යු.: පොලිය ගෙවීම් මීට අයත් නොවේ.

**19.7 ආයතනයේ දේපළ රක්ෂණය කිරීම වෙනුවෙන් ගෙවන රක්ෂණ වාරික**
ස්වභාවික විපත්, ගිනි සහ පාඩු යන ආදිය වෙනුවෙන් ආයතනය විසින් සිදු කරන ලද රක්ෂණය කිරීම් වලට අදාළ වාරික ගෙවීම් මීට අයත් වේ.
සැ.යු.: ජීවිත රක්ෂණ වලට අදාළ වාරික ගෙවීම් මීට අදාළ නොවේ.

**19.8 බදුකුලී ගෙවීම්**
බදුකුලී පදනම මත ලබා ගත් ප්‍රාග්ධන භාණ්ඩ සහ පදිංචිය සඳහා නොවන ගොඩනැගිලි වෙනුවෙන් කරන ලද ගෙවීම් මීට අයත් වේ.
සැ.යු.: මූල්‍ය කල්බදු ගෙවීම් මීට අයත් නොවේ.

**19.9 නිෂ්පාදනය මත පනවන වෙනත් බදු**

රජය විසින් බදු අයකිරීම ප්‍රධාන වශයෙන් කොටස් දෙකකි. එනම් කිසියම් ආයතනයක් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ ඒකක ගණන පදනම් කරගෙන අයකරනු ලබන බදු (Taxes on product) සහ සමස්ථ නිෂ්පාදන ක්‍රියාවලිය මත පනවන වෙනත් බදු (Other taxes on production) වශයෙනි. මෙහි දී <u>සමස්ථ නිෂ්පාදන ක්‍රියාවලිය මත පනවනු ලබන බදු පමණක් මේ යටතේ ගැනේ.</u>

උදා: පාරිසරික බදු, දේපළ බදු

**19.12 වෙනත් කාර්මික නොවන සේවා සඳහා වියදම්**

ආයතනික කටයුතු වෙනුවෙන් ලබා ගන්නා ලද නීතිමය සේවා, උපදේශන සේවා, ගිණුම් සේවා සහ විගණන සේවා, මෙන්ම ආයතනය විසින් සංවිධානය කරනු ලබන රැස්වීම් සහ විනෝදාත්මක කටයුතු යන ආදිය වෙනුවෙන් දරන ලද වියදම් මීට අයත් වේ.

සැ.යු.:

ලාභාංශ ගෙවීම්, පොලිය ගෙවීම්, දඩ ගෙවීම්, පේටන්ට් සහ බලපත්‍ර මුළුමනින් ම මිල දී ගැනීම්, ඉඩම් අලෙවි කිරීම සහ වෙනත් ප්‍රාග්ධන භාණ්ඩ මිල දී ගැනීම, පරිත්‍යාග, ක්ෂයවීම් සහ ණය කපාහැරීම් යන ආදිය සඳහා වූ වියදම් මීට ඇතුළත් නොකළ යුතුය.

## ප්‍රශ්න අංක 20. අමුද්‍රව්‍ය, ඇසුරුම් ද්‍රව්‍ය, අලෙවි කිරීම සඳහා මිල දී ගත් භාණ්ඩ සහ ඉන්ධන වල වටිනාකම

**(iv) තීරුව : 2020 වර්ෂය තුළ මිල දී ගැනීම්**

2020 වර්ෂය තුළ නිෂ්පාදනය සඳහා ආයතනය මගින් මිල දී ගත් සියලුම අමුද්‍රව්‍ය, ඇසුරුම් ද්‍රව්‍ය, අලෙවි කිරීම සඳහා මිල දී ගත් භාණ්ඩ සහ ඉන්ධන වල වටිනාකම මීට ඇතුළත් කළ යුතුය. පිරියම් කිරීම පිණිස වෙනත් ආයතනයකට සැපයූ අමුද්‍රව්‍ය ආදියෙහි වටිනාකම් ද ඇතුළත් කළ යුතුය. මෙහි දී වටිනාකම ඇගයිය යුත්තේ ගැනුම්කරුගේ මිල ගණන් අනුවය. එනම් ගැණුම් මිල, ප්‍රවාහන වියදම්, රක්ෂණ වියදම්, සියලුම අය බදු හා තීරු බදු මෙයට ඇතුළත් වේ. ගැනුම්කරුට දෙන වට්ටම් හා ප්‍රතිදාන හෝ සපයන්නන් වෙතට ආපසු භාර දුන් ඇසුරුම් ද්‍රව්‍ය වල වටිනාකම අඩු කළ යුතුය. මෙම ආයතනයට අනුබද්ධ ආයතන වලින් ලබා ගත් (මිල දී ගත් නොවන) ද්‍රව්‍ය මිල දී ගත් ලෙස සළකා ඇගයිය යුතුය.

**(v) තීරුව : 01.01.2020 දිනට ඉතිරි තොග වල වටිනාකම**

ආයතනය විසින් නිෂ්පාදනය කටයුතු සඳහා මිල දී ගත් අමුද්‍රව්‍ය, ඇසුරුම් ද්‍රව්‍ය, අලෙවි කිරීම සඳහා මිල දී ගත් භාණ්ඩ සහ ඉන්ධන ආදී සියලුම යෙදවුම් වල ආරම්භක තොග මේ යටතේ දැක්විය යුතුය. මෙහි දී තමන්ගේම ස්ථාවර වත්කම් නිපදවීම සඳහා මිල දී ගත් ද්‍රව්‍ය ඇතුළත් නොකළ යුතුය. තව ද ඔබ ආයතනය සතු එහෙත් පිරියම් කිරීම පිණිස වෙනත් ආයතන වෙත භාර දී ඇති ද්‍රව්‍ය තොග ඇතුළත් කළ යුතු අතර පිරියම් කිරීම සඳහා සපයන ලද අන්‍යයන් සතු ද්‍රව්‍ය ඇතුළත් නොකළ යුතුය. අමුද්‍රව්‍ය වල වටිනාකම ගැනුම්කරුගේ මිල අනුව ඇගයිය යුතුය.

**(vi) තීරුව : 31.12.2020 දිනට ඉතිරි තොග වල වටිනාකම**

ඉහත (2) කොටසේ උපදෙස් පිළිපදිමින් නිෂ්පාදනය සඳහා මිල දී ගත් අමුද්‍රව්‍ය , ඇසුරුම් ද්‍රව්‍ය, අලෙවි කිරීම සඳහා මිල දී ගත් භාණ්ඩ සහ ඉන්ධන ආදී සියලුම යෙදවුම් වල වර්ෂය අවසානයේ තොග වල වටිනාකම් ගැනුම්කරුගේ මිල අනුව අගයන්න.

## ප්‍රශ්න අංක 21. ස්ථාවර ප්‍රාග්ධන වත්කම්

ස්ථාවර වත්කම් යනු ආයතනය විසින් භාවිත කරන හෝ භාවිත කිරීමට අපේක්ෂා කරන, වර්ෂයකට වැඩි ආයු කාලයක් පවතින අලුත් හෝ භාවිත කරන ලද භාණ්ඩ වේ. මෙම වත්කම් ස්පෘෂ්‍ය ස්ථාවර වත්කම් ( Tangible Fixed Assets ) සහ අස්පෘෂ්‍ය ස්ථාවර වත්කම් ( Intangible Fixed Assets ) වශයෙන් ප්‍රධාන වශයෙන් කොටස් දෙකකි.

**01. ස්පෘෂ්‍ය ස්ථාවර වත්කම්**

ආයතනයක භාණ්ඩ හෝ සේවා සැපයීමේ දී භාවිතයට ගැනීමට පවතින අන් අයට කුළියට දීමට පවතින හෝ පරිපාලන කටයුතු සඳහා පවත්වා ගන්නා සහ වර්ෂයකට වැඩි කාලයක් භාවිතයට ගැනීමට අපේක්ෂිත ස්පර්ශ කළ හැකි වත්කම් ස්පෘෂ්‍ය ස්ථාවර වත්කම් වේ.

**i). ඉඩම්**

යම් ආයතනයක් පවත්වාගෙන යන ඉඩම් එම ආයතනයේ ස්ථාවර වත්කමක් වන අතර ඊට අදාළ විස්තර මේ යටතේ දැක්විය යුතු ය.

**ii). ගොඩනැගිලි සහ වෙනත් ඉදිකිරීම්**

ආර්ථික කටයුත්ත පවත්වාගෙන යන ගොඩනැගිල්ලක් හෝ යම් ගොඩනැගිල්ලක කොටසක් හෝ වෙනත් ඉදිකිරීමක වටිනකම් මින් අදහස් කරයි. මෙම වත්කම් ප්‍රධාන කොටස් තුනක් යටතේ හඳුනාගත හැකිය. එනම් වාසය සඳහා වූ ගොඩනැගිලි, වාසය සඳහා නොවූ ගොඩනැගිලි සහ වෙනත් ඉදි කිරීම් වශයෙනි.

උදා: නිල නිවාස, කාර්යාල, ගබඩා, ගරාජ්, මාර්ග, කාණු, පාලම්

**iii). යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ**

ආර්ථික ක්‍රියාකාරකම සිදු කිරීමට යොදා ගන්නා ආයතනය සතු සියලුම යන්ත්‍ර සූත්‍ර සහ ඊට අදාළ වෙනත් උපකරණ වල වටිනාකම මින් අදහස් කරයි.

උදා: නිෂ්පාදන ක්‍රියාවලීන් සඳහා යොදගනු ලබන යන්ත්‍ර, විදුලි ජනක යන්ත්‍ර

**iv). ප්‍රවාහන උපකරණ**

පුද්ගලයින් හෝ භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා යොදා ගන්නා මෝටර් රථ හා වෙනත් ප්‍රවාහන උපකරණ මෙයට අදාළ වේ.

උදා : කාර්, වෑන්, ලොරි

**v). පරිගණක හා උපාංග**

ආයතන පරිපාලන හෝ වෙනත් කටයුතු සඳහා යොදාගන්නා පරිගණක හා ඊට අදාළ අනිකුත් උපාංග මීට අයත් වේ.
උදා: පරිගණක ( Desktop/ Laptop), මුද්‍රණ යන්ත්‍ර, ස්කෑන් යන්ත්‍ර

**vi). ගෘහ භාණ්ඩ හා වෙනත් කාර්යාලයීය උපකරණ**

ආයතන කටයුතු පවත්වාගෙන යාම සඳහා යොදා ගන්නා ගෘහ භාණ්ඩ හා අනෙකුත් කාර්යාල උපකරණ වල වටිනාකම මෙයින් අදහස් කරයි.

උදා: මේස, පුටු, කබඩ්, ෆැක්ස් යන්ත්‍ර, දුරකථන යන්ත්‍ර

**vii). කරගෙන යනු ලබන වැඩ (Work in Progress)**

ස්ථාවර වත්කමක් ලෙස හඳුනාගත හැකි නමුත් 2020.12.31 දින වන විට ද ඊට අදාළ කටයුතු අවසන් කර නොමැති කරගෙන යනු ලබන කටයුතු වල වටිනාකම් මෙමඟින් අදහස් කරයි. තවද මෙම වත්කම් නිෂ්පාදනයක් හෝ සේවා සැපයීමක් සඳහා යොදා ගත නොහැකිය.

උදා: ඉදිකරගෙන යනු ලබන ගොඩනැගිල්ල

**viii). වෙනත් ස්පෘෂ්‍ය ස්ථාවර වත්කම්**

ඉහත 1 සිට 7 දක්වා කාණ්ඩ යටතේ සඳහන් කළ ස්පෘෂ්‍ය ස්ථාවර වත්කම් වලට අමතරව වෙනත් ස්පෘෂ්‍ය වත්කමක් ආයතනය සතුව පවතී නම් එම වත්කමෙහි නම සඳහන් කර අදාළ විස්තර සැපැයිය යුතු වේ.

උදා: මැණික්, ස්වර්ණාභරණ, පුරාවස්තු (Antiques)

**02. අස්පෘෂ්‍ය ස්ථාවර වත්කම්**

භාණ්ඩ නිෂ්පාදනයේ දී හෝ සේවා සැපයීමේ දී භාවිතයට ගැනීමට පවතින අන් අයට කුළියට දීමට හෝ පරිපාලන කටයුතු සඳහා පවත්වා ගන්නා භෞතික පැවැත්මක් නැති මූල්‍ය නොවන වත්කම් අස්පෘෂ්‍ය ස්ථාවර වත්කම් වේ.

උදා: වෙළඳ ලකුණ , කීර්ති නාමය, පරිගණක මෘදුකාංග

**iii). තීරුව: වර්ෂය ආරම්භයේ පොතෙහි සඳහන් වටිනාකම**

මින් අදහස් කරන්නේ 2020.01.01 දිනට පොතේ සඳහන් කර ඇති අදාළ ස්ථාවර වත්කමෙහි අගයයි. එය තීරු අංක 03 යටතේ සඳහන් කළ යුතු වේ.

**iv). තීරුව : වර්ෂය තුළ අත්පත් කර ගන්නා ලද ස්ථාවර වත්කම්**

2020 වර්ෂය තුළ දී ආයතනය විසින් අත්පත් කර ගත් ස්ථාවර වත්කම් වල වටිනාකම මේ යටතේ දැක්විය යුතු ය. එනම් වර්ෂය තුළ දී ආයතනය විසින් එකතු කරන ලද අලුත් හා භාවිතා කළ ප්‍රාග්ධනය සඳහා කරන ලද වියදම් වල එකතුවෙන් වර්ෂය තුළ අලෙවි කරන ලද ප්‍රාග්ධනයේ වටිනාකම අඩු කිරීමෙන් මෙම අගය ලබා ගත හැකිය.

තව ද පවතින ස්ථාවර වත්කම් වල සාමාන්‍ය ආර්ථික ආයු කාලය දීර්ඝ කරන්නා වූ ද නිෂ්පාදනය වැඩි කරන්නා වූද, ප්‍රධාන පෙළේ එකතු කිරීම්, වෙනස් කිරීම් හා වැඩි දියුණු කිරීම් මෙමඟින් ආවරණය කෙරේ. එකම සමාගමකට අයත් වෙනත් ආයතනයකින් ලැබුන ස්ථාවර වත්කම් ද මිල දී ගත් ස්ථාවර වත්කම් සේ සළකා මීට ඇතුළත් කළ යුතු ය. ඇගයිය යුත්තේ ගැනුම්කරුගේ මිළ ගණන් අනුවය.

**v). තීරුව : ආයතනය විසින්ම කරන ලද ප්‍රාග්ධන සම්පාදන**

ඇතැම් ආයතන තම ආයතනය සතු සම්පත් යොදාගෙන ආයතනය විසින්ම ඇතැම් ස්ථාවර වත්කම් සම්පාදනය කරනු ලැබේ.

උදා: ආයතනයක් තමා සතු සම්පත් උපයෝගී කර ගෙන සකස් කරන ලද මුරකුටිය

**vi). තීරුව : වර්ෂය තුළ ස්ථාවර වත්කම් වල ක්ෂයවීම් (ස්පෘශ්‍ය හා අස්පෘශ්‍ය වත්කම්)**

පාවිච්චිය, කල්ගත වීම, යල් පැනීම වැනි කවර හෝ හේතුවක් මත වත්කමක අගය ප්‍රමාණාත්මක වශයෙන් හෝ ගුණාත්මක වශයෙන් අඩුවීම ක්ෂය වීම ලෙස සරලව හැඳින්විය හැකිය. නැතහොත් යම් ස්ථාවර වත්කමක ප්‍රයෝජනය දිගුකාලීන බැවින් වසර ගණනාවක ආදායම් ඉපයීමකට දායක වේ. එම නිසා වත්කම සඳහා දරන වියදමක් එම වසර ගණනවකටම අදාළ විය යුතුය. එබැවින් ස්ථාවර වත්කම් වල පිරිවැය එම වත්කමෙහි ජීවිත කාලය පුරා බෙදාහැරීම ක්ෂය කිරීම මගින් සිදු වේ. අස්පෘශ්‍ය වත්කම් වල ක්ෂයවීම් "**ක්‍රමක්ෂය**" (Amortization) ලෙස හඳුන්වයි.

## ප්‍රශ්න අංක 22. සේවා නියුක්තිය හා ඉපැයීම්

### ❖ නියුතු පුද්ගලයින් ගණන (ii, iii හා iv තීරු)

මෙයින් අදහස් කරනුයේ 2020 වර්ෂය තුළ දී ආයතනයෙහි සේවයේ නියුතු පුද්ගලයින්ගේ සාමාන්‍ය ගණනයි. මෙය 2020 පෙබරවාරි, මැයි, අගෝස්තු සහ නොවැම්බර් මාස වල දී පඩිපතේ සඳහන් පුද්ගලයින් සංඛ්‍යාවේ සාමාන්‍ය ගණනය කිරීමෙන් ලබාගත හැකිය.

**(1) ක්‍රියාකරන්නන්**

නිෂ්පාදනය හා ඊට අදාළ කාර්යයන්හි ඍජුවම නියුතුව සිටි සියලුම සේවකයින් මෙයට ඇතුළත් විය යුතුය.

උදා: භාණ්ඩ තැනීමේ, පිරියම් කිරීමේ හෝ එකලස් කිරීමේ නියුතු පුද්ගලයින්, ගබඩාකරුවන්, පරීක්ෂා කිරීමේ හා වාර්තා තැබීමේ නියුතු පුද්ගලයින් හා පරීක්ෂකවරුන්

සැ.යු.: ෆෝමන් වරුන්ට වඩා උසස් පරීක්ෂක ශ්‍රේණීන් මෙයට ඇතුළත් නොකළ යුතුය.

ආයතනයේ නිෂ්පාදන වෙනත් අංශයකට අදාළ වේ නම් කෘෂිකර්මය, වැවිලි කර්මාන්තය, ගොවිපලවල් ආදියට සම්බන්ධ සේවකයින් අත්හල යුතුය.

උදා: තේ කර්මාන්ත ශාලාවක් හෝ රබර් කර්මාන්ත ශාලාවක් නම් වතු කම්කරුවන්, තේ දළු නෙළන්නන්, රබර් කිරි කපන්නන් යනාදීන් ඇතුළත් නොකළ යුතුය. ක්‍රියාකරන්නන් සංඛ්‍යාව පුහුණු හා නුපුහුණු වශයෙන් වෙන වෙනම ඇතුළත් කරන්න.

**(අ). පුහුණු**

යම් කිසි කාර්යයක විශේෂ පුහුණුවක් හෝ පළපුරුද්දක් ලැබුවා වූ ද, හදිසියෙන් නුපුහුණු කෙනෙකුට කළ නොහැකි වූ ද කාර්යයන්හි නියුතු පුද්ගලයින් මෙයට ඇතුළත් වේ.

උදා: වඩුවන්, මේසන්වරු, විදුලි කාර්මිකයින්, මෝටර් මෙකැනික්වරුන්, වෑල්ඩින්කරුවන් ආදීන්ය.

**(ආ). නුපුහුණු**

මෙම ගණයට අයත් වනුයේ, යම් කාර්යයක පුහුණුවක් නොලැබූ හෝ පළපුරුද්දක් අවශ්‍ය නොවන්නා වූ හා වෙනත් ඕනෑම කෙනෙකු ආදේශ කළ හැකි කාර්යයන්හි නියුතු පුද්ගලයින්ය. එවැනි පුද්ගලයින්ට තමන් පරිහරණය කරන යන්ත්‍ර හෝ ද්‍රව්‍ය පිළිබඳව දැනීමක් අවශ්‍ය නොවේ.

උදා: කම්කරුවන්, පණිවිඩකරුවන් ආදීන්

**(2) වෙනත් සේවකයින්**

මෙයට ක්‍රියාකරන්නන් හැර අන් සියලුම වැටුප් ලබන සේවකයින් ඇතුළත් කළ යුතුය. අයිතිකරුවන්, කොටස්කරුවන් හා වැටුප් නොලබන පවුලේ වැඩකරුවන් ඇතුළත් නොකළ යුතුය.

**(අ) පරිපාලන / කළමනාකාර**

මෙහි ආයතනයේ පරිපාලන හා අධීක්ෂණ කටයුතු වල නියුතු පුද්ගලයින් සංඛ්‍යාව ඇතුළත් කළ යුතුය.

උදා: කම්හල් කළමනාකාරවරු, ඉංජිනේරුවන්, ගණකාධිකාරීන්

**(ආ) තාක්ෂණික හා අධීක්ෂණ**

මෙම ගණයට ඇතුළත් වන්නේ නිෂ්පාදනවල තාක්ෂණ හා විද්‍යාත්මක අංශයන්ට සම්බන්ධ හා එම අංශයන්හි අධීක්ෂණ කටයුතු වල නියැලි පුද්ගලයින් වේ. මෙමඟින් කාර්මික ශිල්පීන්, පර්යේෂණ නිලධාරීන් හා තත්ව පාලන නිලධාරීන් වැන්නන් ආවරණය කෙරේ.

**(ඇ) ලිපිකාර හා අනුබද්ධ**

මෙම කොටසට සාමාන්‍ය ලිපිකරුවන්, යතුරු ලේඛකයින් හා ලඝු ලේඛකයින් වැනි අය අයත් වේ.

**(ඇ) වෙනත්**

මෙහි ඉහත සඳහන් ශ්‍රේණි වලට ඇතුළත් නොවූ සියලුම සේවකයින් ඇතුළත් කළ යුතුය. උදා: රියදුරන්, මුරකරුවන්, ආරක්ෂක නිලධාරීන් හා පිළිගැනීමේ නිලධාරීන් ඇතුළත් විය යුතුය.

**(3) ක්‍රියාකාරී අයිතිකරුවන් හා ක්‍රියාශීලී හවුල්කරුවන්**

ආයතනයේ කටයුතු වලට ක්‍රියාකාරීව සහභාගී වන අයිතිකරුවන් හා හවුල්කරුවන් ඇතුළත් කළ යුතුය. අයිතිය කොටස් මඟින් නියෝජනය වන ඒකාබද්ධිත හෝ එවැනි ව්‍යාපාර වලට මෙම කොටස අදාළ නොවේ. එවැනි ව්‍යාපාර වල කළමනාකරුවන් හා වැටුප් සඳහා වැඩ කරන අධ්‍යක්ෂක වරුන් වෙනත් සේවකයින් ලෙස වාර්තා කළ යුතු වේ.

**(4) වැටුප් නොලබා සේවය සපයන පවුලේ සාමාජිකයින්**

අයිතිකරුගේ නිවසේ පදංචිව සිටිමින් නියමිත වැටුපක් නොලබා, දිනක සාමාන්‍ය වැඩ කරන කාලයෙන් අඩු වශයෙන් 1/3 ක් වත් ආයතනයෙහි වැඩ කරන පුද්ගලයින් මීට අයත් වේ. නිවසින් බැහැරව සිට වැටුප් රහිතව වැඩ කරන අය ද මෙයට ඇතුළත් කළ යුතුය.

❖ **වැටුප් හා වේතන : v. තීරුව**

ආයතනයේ සේවකයින් ලෙස ගැනෙන සියලුම පුද්ගලයින් වෙත ඉටු කරන ලද වැඩ සඳහා වර්ෂය තුළ දී සේවා යෝජකයා විසින් මුදල් වශයෙන් හෝ ද්‍රව්‍යමය වශයෙන් ගෙවන ලද සියලුම ගෙවීම් මීට ඇතුළත් කළ යුතුය. මීට

- සියලුම මූල්‍යමය ගෙවීම්, පාරිතෝෂික දීමනා හා ජීවන වියදම් දීමනා
- රක්ෂණ දායක මුදල් වැනි සේවකයා විසින් ගෙවිය යුතු නමුත් සේවා යෝජකයා විසින් අඩු කරනු ලැබූ මුදල්
- ද්‍රව්‍යමය ගෙවීම් ( තම සේවකයින්ට නොමිලේ හෝ බෙහෙවින් අඩු මුදලකට සපයනු ලබන භාණ්ඩ හා සේවා) ඇතුළත් වේ.

## ප්‍රශ්න අංක 23.

ඔබ ආයතනයේ 2020 ජූලි 31 දිනට වැඩිම පුරප්පාඩු සංඛ්‍යාවක් ඇති රැකියා 5ක් ප්‍රමුඛතාවයමත පදනම්ව අදාළ වගුවෙහි නම් කොට දක්වන්න.